# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2167/10 - 2020 මාර්තු මස 18 වැනි බදාදා - 2020.03.18**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත**

5 වැනි වගන්තිය යටතේ නියමය

2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 5 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මම, 2020 මාර්තු මස 03 දිනැති අංක 2165/12 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ උපලේඛනය මගින් දක්වා ඇති සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක 03.02 සහ 03.03 යටතට වැටෙන මාළු (සංයෝජිත වර්ගීකරණ සංකේතාංක 0303.54 යටතට වැටෙන මැකරල් මසුන් හැර) සඳහා අදාළ වන 10% හෝ කිලෝ ග්‍රෑමයකට රු. 150ක් වන විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්දෙන්, ධීවර අමාත්‍යාංශයේ නිර්දේශයට යටත්ව, 2020 මාර්තු මස 04 වැනි දින හෝ ඊට පෙර නැව්ගත කර ඇති බවට නෞභාර පත (Bill of Lading) මගින් සනාථ කෙරෙන, ආනයනය කෙරෙන මාළු සඳහා කිලෝ ග්‍රෑමයකට රු. 25 ක් අයකරගෙන, ඉතිරි වටිනාකම අත්හරිනු ලැබිය යුතු බවට මෙයින් නියම කරනු ලැබේ.

**මහින්ද රාජපක්ෂ,**
මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍ය.

2020 මාර්තු මස 18 වැනි දින,
කොළඹ 01,
මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශයේ දී ය.